# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1767/16 – 2012 ජූලි 18 වැනි බදාදා – 2012.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැනුම්පති විසින් පිළියෙල කර සකස් කර ඇති අංක 3910 සහ 2011.11.08 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දක්වා ඇති, ප්‍රමාණයෙන් හෙක්. 0.4360ක් පමණ වන පහත විස්තර කර ඇති ඉඩම:

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: ගල්කන්ද නොහොත් ගෝන්ගහකැලේ නොහොත් ගෝනගල කැලේ; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ වැසිකිළියක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: නවදගල, හිපන්කන්ද විද්‍යා සමාධි පිරිවෙනද විහාරාධිපති පූජ්‍ය හිපන්කන්ද සද්ධාසිරි හිමි; ප්‍රමාණය: හෙක්. 0.4360.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 ඔක්තෝබර් මස 31 වැනි දින අ.භා. 2.00ට මා සම්මුඛ විය යුතුය.

1A – G 16329 – 360 (2012/07)

තවද, 2012 ඔක්තෝබර් මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්. එන්. එස්. ටී. කේ. ද සිල්වා,
ප්‍රාදේශීය ලේකම්,
කරන්දෙණිය

2012 ජූලි මස 13 වැනි දින,
කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 69

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිණිගම නමැති ගමේ අවසාන ගම් පිඹුරු 19 පත්‍ර අංක 75 අතිරේක අංක 68 හි ප්‍රමාණයෙන් හෙක්. 0.302ක් පමණ වන පහත විස්තර කර ඇති ඉඩම:

01. **කැබලි අංක 1545**

ඉඩමේ නම: -; විස්තරය: මුඩුබිම; හිමිකම් කියන අය: එල්. බී. ප්‍රනාන්දු අංක 282/1, වැතැම් වීදිය, කොළඹ 12; ප්‍රමාණය: හෙක්. 0.302

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 ඔක්තෝබර් මස 02 වැනි දින පෙ.ව. 9.00 ට බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 සැප්තැම්බර් මස 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩී. එම්. ඉන්ද්‍රා දිසානායක
ප්‍රාදේශීය ලේකම්,
බණ්ඩාරවෙල.

2012 ජූලි මස 04 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 70